ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

## පුවත්පත් නිවේදනය

## ඉන්දීය ප්‍රදාන සහයෝගය සහිතව මුලතිව් දිස්ත්‍රික්කයේ ඉදි කරන ලද චන්ද්‍රරත් නගර් ආදර්ශ ගම්මානය විවෘත කෙරේ

2025 මැයි 28 වන දින ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් සන්තෝෂ් ජා මැතිතුමා සහ නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍ය අනුර කරුණාතිලක මැතිතුමා මුලතිව් හි චන්ද්‍රරත් නගර් ආදර්ශ ගම්මානය විවෘත කර ප්‍රතිලාභී පවුල් විසි හතර වෙත භාර දුන්හ. උතුරු පළාත් ආණ්ඩුකාර නාගලිංගම් වේදනායගන් මහතා සහ පාර්ලිමේන්තු මන්ත්‍රී වෛද්‍ය සෙල්ලතම්බි තිලකානාදන් මහතා ද මෙම අවස්ථාවට සහභාගී වූහ.

2. මුලතිව් දිස්ත්‍රික් ලේකම්තුමා, ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සභාපතිතුමා සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශයේ, උතුරු පළාත් සභාවේ සහ මුලතිව් දිස්ත්‍රික් පරිපාලනයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් රැසක් ද මෙම උත්සවය සඳහා සහභාගී වූහ.

3. මහ කොමසාරිස් සන්තෝෂ් ජා මැතිතුමා විශේෂයෙන්ම උතුරු පළාතේ ජීවනෝපාය මාර්ගයන් ඉහළ නැංවීම සහ ප්‍රජාවන්ගේ සංවර්ධනය සඳහා සහයෝගය ලබා දීම ඇතුළු ශ්‍රී ලංකාවේ සංවර්ධනයට සහය වීම සඳහා ඉන්දියාවේ දැඩි කැපවීම අවධාරණය කළේය. අමාත්‍ය අනුර කරුණාතිලක මැතිතුමා විශේෂයෙන්ම නිවාස සංවර්ධනය ඇතුළු ඉන්දියාව විසින් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කරනු ලබන ජනතා කේන්ද්‍රීය සංවර්ධන ව්‍යාපෘතීන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ස්තුතිය පළ කළේය.

4. ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය සඳහා වන අවබෝධතා ගිවිසුම සඳහා ඉන්දීය රජය සහ ශ්‍රී ලංකා රජය විසින් 2017 ඔක්තෝබර් මාසයේ දී අත්සන් තබන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ පවුල් 24ක් සඳහා වන ආදර්ශ ගම්මානය බැගින් ශ්‍රී ලංකාවේ සෑම දිස්ත්‍රික්කයකම අඩු ආදායම්ලාභී පවුල් 600ක් සඳහා නිවාස ඉදි කෙරෙනු ඇත. ඉන්දියානු රජයේ ප්‍රදාන සහයෝගය සහිත ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය සමඟින් ක්‍රියාත්මක වෙමින් පවතී.

5. මෙම ව්‍යාපෘතිය යටතේ ඉදිකළ ජිම් බ්‍රවුන් නගර් ආදර්ශ ගම්මානය 2025 මැයි 25 වන දින විවෘත කරන ලදී. දිස්ත්‍රික්ක 13ක ඉදි කළ ආදර්ශ ගම්මාන ප්‍රතිලාභීන් වෙත භාර දී ඇත. ව්‍යාපෘතියේ සමස්ත ප්‍රගතිය 97% ඉක්මවන අතර ඉතිරි ආදර්ශ ගම්මාන ද නුදුරේදී ම ප්‍රතිලාභීන් වෙත භාර දීමට නියමිත ය.

****

**කොළඹ**
2025 මැයි 29